# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1759/6 - 2012 මැයි 21 වැනි සඳුදා - 2012.05.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතු කොට ගෙන උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

හෙන්ඩියගල පඤ්ඤාරංසි හිමි නම් වූ සභිකයා අයත්වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන රත්නායක මුදියන්සේලාගේ හරිශ්චන්ද්‍ර හේරත් රත්නායක මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී අබ්දුල් ඔෆූර් මුහම්මදු නෆීල් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, රත්නායක මුදියන්සේලාගේ හරිශ්චන්ද්‍ර හේරත් රත්නායක මහතා උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. ඕ. එම්. නෆීල්,
තේරීම්භාර නිලධාරී,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2012 මැයි මස 14 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
කුරුණෑගල.

06 - 245

1A - G 16053 — 350 (2012/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.